**දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතිය (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම) - 2017**

--------------------------------------------------------------------------------------------------------

දකුණු මාර්ග සම්බන්ධ කෙරෙන ව්‍යාපෘතියේ (අධිවේගී මාර්ග සම්බන්ධතා වැඩි දියුණු කිරීමේ සැලැස්ම) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2014 මැයි 27 දින එළඹි අංක 3028 එස්ආර්අයි (එස්එෆ්) දරන ණය ගිවිසුමේ ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග සහ මාර්ග සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. අධිවේගී මාර්ග ජාලය සම්බන්ධ කෙරෙන ජාතික මහාමාර්ග පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලසුම් පිළියෙල කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.ණය ගිවිසුම අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 801.34 කට සමාන එජඩො මිලියන 6.08 ක් වූ අතර ඉන් රු.මිලියන 659 කට සමාන එජඩො මිලියන 5 ක් සැපයීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු 22 දින ආරම්භ කරන ලද අතර 2019 ජූනි 30 වන විට නිම කිරීමට නියමිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත

සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) අග්‍රිම අරමුදල් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ, එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

--------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) විශේෂ ඩොලර් ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූරණය කිරීම්, ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව.

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පරිචය අනුව, ව්‍යාපෘතිය මූල්‍ය වර්ෂය අවසානයේදී උපචිත වියදම් තක්සේරු කිරීමට සහ ඒ පිළිබඳව ප්‍රතිපාදනයන් වෙන් කිරීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. එම නිසා 2016 හා 2017 වර්ෂ අවසානයේ ගෙවිය යුතු ගොඩනැගිලි කුලිය පිළිවෙලින් රු.මිලියන 6.52 ක් හා රු.මිලියන 4.21 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනයට අදාළ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2017 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ආ:ස:බැ | 5.00 | 659.00 | 270.00 | 0.45 | 69.07 | 3.59 | 548.69 |
| ශ්‍රී:ලං:ර | 1.08 | 142.34 | 15.00 | - | 3.26 | - | 27.66 |
| **එකතුව** | 6.08 | 801.34 | 285.00 | 0.45 | 72.33 | 3.59 | 576.35 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉහත තොරතුරු අනුව, ණය දෙන ආයතනය විසින් ලබාදෙන ලද රු. මිලියන 659 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 05 ක සම්පූර්ණ ප්‍රතිපාදන වලින් රු.මිලියන 548.69 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 3.59 ක් එනම් මුළු ප්‍රතිපාදනයෙන් 83 ප්‍රතිශතයක් පමණක් ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භකර වසර 3.5 ක් ගෙවී ගිය පසු එනම් 2017 දෙසැම්බර් 31 දිනට උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදනය කරන ලද අරමුදල් උපයෝජනය කිරීමේ ප්‍රගතිය මන්දගාමීව පැවතුණු බව නිරීක්ෂණය විය,එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති කාලසීමාව තුල ඉලක්කයන් සපුරා ගැනීමට වගකීම් නියම කිරීම් ද ඇතුළත්ව සම්පූර්ණ ව්‍යාපෘති කාලය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය, අර්ධවාර්ෂික වශයෙන් භෞතික හා මූල්‍යමය ඉලක්කයන් ඉස්මතුවන ලෙස සවිස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් සකස්කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කාර්යමාලාව පදනම්ව ප්‍රවර්තන වර්ෂයේ විස්තරාත්මක අයවැය ව්‍යාපෘතිය විසින් පිලියෙලකර නොතිබුණි. එම නිසා ප්‍රවර්තන වර්ෂයේ රු.මිලියන 15 ක අයවැය ඇස්තමේන්තු ප්‍රතිපාදන මුදලින් රු.මිලියන 3.26 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

(අ) ලද තොරතුරු අනුව, ව්‍යාපෘතිය විසින් දක්ෂිණ අධිවේගී මාර්ගයට සම්බන්ධිත ජාතික මහාමාර්ග කිලෝමීටර 200 ක් සඳහා පිරික්සීම, ශක්‍යතා අධ්‍යයනය හා විස්තරාත්මක ඉංජිනේරු සැලැස්ම නිර්මාණය සඳහා විදේශීය උපදේශණ සේවා ලබා ගැනීමට 2014 දෙසැම්බර් 09 දින රු.මිලියන 3.48 කට ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත්ව සම්පූර්ණ කර 2016 අගෝස්තු 31 දින සියළුම භාර දිය හැකි දෑ ඉදිරිපත් කරන ලදී. එකම අවස්ථාවේදී ප්‍රධාන උපදේශක සඳහා සහයෝගයක් ලෙස 2014 නොවැම්බර් මස පාලම් ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව, මහා මාර්ග ඉංජිනේරු විද්‍යාව හා ප්‍රවාහන සැලසුම් සඳහා උපදේශණ සේවා කොන්ත්‍රාත්තු 03 ක් ප්‍රදානය කෙරිණි. එයද 2017 දෙසැම්බර් 31 දින දී සම්පූර්ණ කර තිබුණි. අන්තර් ජාතික මහාමාර්ග ඉංජිනේරු ශිල්ප ක්‍රම භාවිතය, පාලම් හා ව්‍යුහාත්මක ඉංජිනේරු ශිල්ප ක්‍රම භාවිතය , රථ වාහන සැලසුම් කිරීම හා පුරෝකකථන විශ්ලේෂණ හා ප්‍රවාහන සැලසුම්කිරීම ආදී යොදාගැනීමේ අරමුණින් වෙනත් අමතර උපදේශණ සේවා කොන්ත්‍රාත් 04 ක් රු.මිලියන 68.6 ක පිරිවැයකට වෙනත් උපදේශණ සේවා ආයතනවලට ලබා දී තිබුණි. අන්තර්ජාතික මහාමාර්ග ඉංජිනේරු ශිල්ප ක්‍රම භාවිතය, පාලම් හා ව්‍යුහාත්මක ඉංජිනේරු ශිල්ප ක්‍රම භාවිතය ආදියට අදාල වාර්තාවන් මාස 17 කට වඩා ප්‍රමාදයක් සහිතව 2017

දෙසැම්බර් 31 දින ඉදිරිපත් කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද,රථ වාහන සැලසුම් කිරීම හා පුරෝකකථන විශ්ලේෂණය සහ ප්‍රවාහන සැලසුම්කිරීම් අරමුණින් පිළියෙල කරන ලද වාර්තාවන් 2017 දෙසැම්බර් 31 දින යොමු කිරීමට අවශ්‍ය වුවද, 2018 මැයි 31 දින වන විටත් යොමු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අදාල උපදේශකයන්ගෙන් අපේක්ෂා කල දායකත්වය අඩු වූ නිසා මාර්ග සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ජාතික මාර්ග සැලැස්මේ සංරචක කිපයක් සම්පූර්ණ කිරීමට නොහැකි විය.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

උපදේශන ගිවිසුම්වලට අනුව අධිවේගී මාර්ග ජාලයට සම්බන්ධ කිලෝමීටර 413.79 ක ජාතික මහා මාර්ග පිරික්සීම,ශක්‍යතා අධ්‍යයනය සහ විස්තරාත්මක ඉංජිනේරුමය සැලසුම් සකස් කිරීමට භාජනය කරන ලදි. එයින් කිලෝමීටර 200 ක දුරකට පමණක් ව්‍යාපෘති කාල සීමාව තුල විස්තරාත්මක සැලසුම් සකස් කළ යුතු යැයි අපේක්ෂා කෙරේ.කෙසේ වෙතත් මුලින් තීරණය කරන ලද විෂයපථයට ඇතුලත් නොවන කි.මී 72.59 ක ජාතික මහා මාර්ග තෝරාගෙන පිරික්සීම හා ශක්‍යතා අධ්‍යයනය හා ඊට අදාල විස්තරාත්මක නිර්මාණ සැකසීම සම්පූර්ණ කර තිබුණි.

## 3.4 මතභේදයට තුඩු දෙන කරුණු

---------------------------------

2017 දෙසැම්බර් 31 දිනට උපදේශකයින්ට ගෙවන ලද ගෙවීම් මත රු මිලියන 22.8 ක එකතුකළ අගය මත බදු සහ රු.මිලියන 4.15 ක ජාතිය ගොඩනැගීමේ බදු ගෙවා තිබුණි.කෙසේ වෙතත් ක්‍රියාත්මක කරන ආයතනය විසින් විදේශීය උපදේශකයින්ට කරන ගෙවීම් දේශීය බදු ගෙවීම්වලින් නිදහස් කර ගැනීමට පියවර ගෙන නොතිබුණි.තවද ව්‍යාපෘතිය විසින් උපදේශකයින්ගේ ඉපයීම් මත ගෙවිය යුතු ආදායම් බදු රු.මිලියන 12.10 ක මුදලක් ඔවුන් වෙනුවෙන් ගෙවා තිබුණි.